# 8 ජනකවි

ජනකවි අතීතයේ සිට ම මිනිසුන් අතර කටින් කට පැවත ආ කාව්‍ය විශේෂයකි. ජන ජීවිතයේ දී හා ඔවුන්ගේ වෘත්තීන්වලදී අත් විඳි විවිධ අත්දැකීම් මෙම ජනකවිවලට වස්තු වී ඇත. විවිධ ජනකවි වර්ග ඇත. පැල් කවි, බඹර කවි, ගැල් කවි, තේරවිලි කවි, නෙළුම් කවි, ඉන් සමහරකි.

1. ඉන්නෙත් දුම්බරයි මහ කළු ගලක් යට
කන්නෙත් කරවලයි රට හාලේ බතට
බොන්නෙත් බොරදියයි පූරුවෙ කළ පවට
යන්නේ කවදාද මවුපියො දකින්නට



2. ගසට නමකි ගස මැරුණම වෙන නමකි
ගෙඩියට නමකි ගෙඩියේ සුඹුලට නමකි
මදයට නමකි මද කනකොට වෙන නමකි
මෙතුන් පදේ තෝරාලා කියන් සකී

3. කතරගමයි දේවාලය දෙවියන්ගේ
අතරමඟයි අද අපි දිය නෑවේ නගේ
සතර දෙනයි ගෑවේ රත් සඳුන් ඇගේ
වතුර හොඳයි කවදත් නිල්වලා ගගේ



4. වෙල්යායක ගොන්බානක් කකා වුණී
ඉන් එක ගොනෙක් වලිගය නැතිව වැනි වැනී
වලිගය ඇති ගොනා මැස්සන්ට බැට දුනී
දුප්පත්කමත් වලිගය නැති ගොනා වැනී



5. වැල්ලේ පිපෙන බිම්මල වාසනාවන්
ගොල්ලේ පිපෙන පන්මල වාසනාවන්
පෝයදාට පුන්සඳ වාසනාවන්
ජාතිත් අපේ මවුපියො වාසනාවන්

6. උඩින් යන්ඩ රන් තැටියක් ලැබීයන්
බිමින් යන්ඩ මුතු කුඩයක් ලැබීයන්
තනියම යන කලට පිරිවර ලැබීයන්
අපෙ අම්මා ජාතිත් මට ලැබීයන්

## ක්‍රියාකාරකම්

1. මේ කවිපෙළ තාලානුකූල ව ගායනා කරන්න.

2. කවිපෙළ කියවා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   i. පළමු වන කවියේ කියැවෙන පරිදි බොරදිය බීමට සිදු වී ඇත්තේ ඇයි?

   ii. දෙවන කවියේ කියැවෙන තේරවිල්ල තෝරා ලියන්න.

   iii. කවි පන්තියේ සඳහන් ගංගාව කුමක් ද?

   iv. රත් සඳුන් ගෑ අය කීදෙනෙක් ද?

   v. ගොන්බානක් කකා උන්නේ කොහේ ද?

   vi. දුප්පත්කම සමාන කර ඇත්තේ කුමකට ද?

   vii. "අපේ අම්මා ජාතිත් මට ලැබීයන්" යන ප්‍රාර්ථනයේ අදහස කුමක් ද?

### භාෂා භාවිතය

1. මේ වචනවල විරුද්ධ පද ලියන්න.

| | | | |
|---|---|---|---|
| වාසනාව | | දුප්පත් | |
| පව | | කනිෂ්ඨ | |
| සුලබ | | ප්‍රවීණ | |

2. වරහන් තුළින් නිවැරැදි අකුර තෝරා ලියන්න

i. .................................................. ය ( ණ / න )

ii. ග .................................................. තය ( නි / ණි )

iii. .................................................. දරුවා ( ළ / ල )

iv. ගැහැ .................................................. ය ( නි / ණි )

v. සමු .................................................. ව ( ළු / ලු )

vi. ඇස .................................................. ( ළ / ල )

vii. ප .................................................. ( ලා / ළා)

viii. න.................................................. ල ( ළ / ල )

ix. මැති .................................................. ය ( නි / ණි )

x. පිළිවෙ .................................................. ( ල / ළ )

3. සමූහාර්ථවාචී පද යොදා පහත දැක්වෙන වාක්‍යවල හිස්තැන් පුරවන්න. අදාළ සමූහාර්ථවාචී පද රවුම තුළ දැක්වේ.

රංචුව
පොකුරු
පෙළ
පිරිස
පන්තිය
රැළ

උදා: තුරු පෙළ සුළඟට සැලෙයි.

i. මුව.................................................. දිය බීමට එති.

ii. මිදි .................................................. ඉදී නිල් පැහැ ගැන්වෙයි.

iii. තරුණ .................................................. උනන්දුවෙන් වැඩ කරති.

iv. ඇත් .................................................. වැවට බසිති.

v. රථ.................................................. ඉදිරියට ඇදෙයි.

4. ගැළපෙන පරිදි යුගල පද යොදා පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කරන්න. අදාළ යුගල පද කොටුව තුළින් තෝරා ඔබගේ අභ්‍යාස පොතේ ලියන්න.

| | |
|---|---|
| ගමන්බිමන් | ගේදොර |
| නඩුහබ | හට්ටිමුට්ටි |
| ඉඩම්කඩම් | දුකසැප |
| හොඳනරක | ලියුම්කියුම් |

i. අම්මා ළිඳ ළඟට ගොස් ............................................... සෝදන්නට පටන් ගත්තා ය.

ii. කරුණාරත්න මහතා ......................................... විකුණා වෙනත් පළාතක පදිංචියට ගියේ ය.

iii. නරක මිතුරන්ගේ ඇසුර නිසා නිමල් ......................................... වලට පැටලුනේ ය.

iv. නැන්දාගේ ......................................... බැලීමට අම්මා ගමට ගියාය.

v. අමතර......................................... අඩු කරන්නැයි සුනිල්ට තාත්තා අවවාද කළේ ය.

5. පහත සඳහන් වචන යොදාගෙන වාක්‍ය තනන්න.

| | | | |
|---|---|---|---|
| i. | දුප්පත්කම | vi. | පුන්සඳ |
| ii. | දේවාලය | vii. | පෝය ද |
| iii. | අතරමඟ | viii. | රන්තැටිය |
| iv. | දෙවියන් | ix. | මුතුකුඩය |
| v. | දේවාලය | x. | සඳුන් |

6. මේවායේ අදහස් පැහැදිලි කරන්න.

   i. පාරම්පරික
   ii. ආක්‍රමණය
   iii. සදාතනික
   iv. ග්‍රාමීය
   v. ජනප්‍රවාදය

7. පහත සඳහන් යුගල පද යොදා වාක්‍ය සකසා ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

   i. මිලමුදල්
   ii. අඟහිඟ
   iii. අතමිට
   iv. සුන්බුන්
   v. වටින්පිටින්

## රස විඳීම

1. පහත සඳහන් කවි පදය දෙස බලන්න.

   'දුප්පත්කමත් වලිගය නැති ගොනා වැනී'

කවියා දුප්පත්කම වලිගය නැති ගොනෙකුට සමාන කර දක්වයි. එනම් උපමා කර දක්වයි. කවි, ගීත වැනි සාහිත්‍ය නිර්මාණවල දී ලේඛකයෝ උපමා භාවිතා කරති.

පහත සඳහන් වාක්‍යවල අඩංගු උපමා හඳුනාගන්න.

   i. ඔවුහු සමනල රැනක් සේ සතුටින්, සැහැල්ලුවෙන් ගමන් ගත්හ.
   ii. ඇගේ මුහුණ පුන් සඳක් වැනි ය.
   iii. ඔහු සා පැටියෙකු මෙන් අහිංසක පුද්ගලයෙකි.
   iv. සිරිපාලගේ කතාව ඇසූ ගුරුතුමියගේ හදවත වෙඬරු පිඬක් සේ උණු විය.
   v. ඇගේ කෙස් කළඹ කිතුල් රැනක් මෙනි.

2. පහත සඳහන් උපමා යොදා ඒවායේ අදහස් පැහැදිලි වන සේ වාක්‍ය තනන්න.

   i . දියෙන් ගොඩ ගත් මසෙකු මෙන්

   ii. නරියෙකු මෙන්

   iii. නා දලු වැනි

   iv. කළුගලක් මෙන්

   v. මඬේ සිට වූ ඉන්නක් මෙන්

**පැවරුම්**

ගොවියකු දවස ගත කරන ආකාරය පිළිබඳව රචනයක් ලියන්න.